SP2024/PRE-COM/0007

2024.07.19

සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව.

<u>සංදර්ශනාත්මක වැඩසටහන් සඳහා රජයේ මුදල් යොදවමින් අනියමින් මැතිවරණ ප්‍රචාරන කටයුතු සිදු කිරීම</u>

විදේශ රැකියා ලබාදීම, වෘත්තීය පුහුණු තත්වයන් සහතික කිරීම හා විදේශ රැකියාවක සිට මෙරටට පැමිණි පුද්ගලයින් ව්‍යවසායකත්වයන්ට යොමු කිරීම යන අරමුණු සඳහා යැයි පවසමින් කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය මගින් "ගරුසරු", Smart Youth හා Global Fair හෝ එවැනි නම් භාවිතා කරමින් විවිධ වැඩසටහන් දිස්ත්‍රික්ක මට්ටමින් මේ වන විටත් ක්‍රියාත්මක වේ.

මෙම ව්‍යාපෘති වල අරමුණු කෙසේ වෙතත්, මේවා ක්‍රියාත්මක වන ආකාරයෙන් බොහෝ අක්‍රමිකතා ඇති බවට සෑම ප්‍රදේශයකින්ම පාහේ අපගේ නියෝජිතයින් මගින් දැන ගන්නට ලැබේ. එනම්,

1. මෙම වැඩසටහන් සඳහා ප්‍රතිලාභින් තෝරා ගැනීම දේශපාලනික මුහුණුවරකින් සිදු වන අතර, කිසිදු විනිවිදභාවයකින් සිදු නොවේ.
2. දේශපාලන පාක්ෂිකත්වය විනා අවම නිර්ණායක හෝ සපුරා නොමැති බොහෝ පිරිස් ප්‍රතිලාභීන් ලෙස තෝරා ගනී.
3. මහා පරිමාණයෙන් පිරිස් රැස් කරමින් සිදු කරන සෑම වැඩසටහනක් පාහේම සංදර්ශනාත්මක හා මැතිවරණ ප්‍රචාරණාත්මක අරමුණු මූලික කොටගෙන ක්‍රියාත්මක වීම
4. උක්ත සෑම වැඩසටහනක්ම රාජ්‍ය අරමුදල් භාවිතා කොට සංවිධානය කිරීම

අවසන් නොවූ මැතිවරණ කාලසීමාවක හා ජනාධිපති මැතිවරණය පැවැත්වීම සඳහා කාලය එළඹ ඇති වටපිටාවක සංවිධානය වන මෙවන් වැඩසටහන් සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ දැඩි අවධානය යොමු කළ යුතුව ඇත.

සමගි ජන බලවේගය, නො. 592, බංගලා හන්දිය, කෝට්ටේ පාර, පිටකෝට්ටේ.
ஐக்கிய மக்கள் சக்தி, இல. 592, பங்களா சந்தி, கோட்டே வீதி, பிடகோட்டே,
Samagi Jana Balawegaya, No. 592, Bangala Junction, Kotte Road, Pitakotte.
+94 11 287 0211 / +94 11287 0212 +94 11287 8440 generalsecretarysjb@gmail.com

මෙම සැම වැඩසටහනක් තුළම ආහාරපාන, මුදල් ලබා දීම් සිදු වන අතර, එය සෘජුවම මැතිවරණ අල්ලස් යටතට ගැනෙන වරදකි.

කාරුණිකව කඩිනම් අවධානය මෙම වැඩසටහන් සඳහා යොමු කරන ලෙසත්, කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ මුදල් මැතිවරණ ප්‍රචාරණ ව්‍යාපෘති සඳහා නොයොදවන බවට වගබලා ගැනීමට අවශ්‍ය කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටිමි.

ස්තූතියි,

රංජිත් මද්දුම බණ්ඩාර (පා.ම)
මහලේකම්
සමගි ජන බලවේගය

ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර (පා.ම.)
මහ ලේකම්
සමගි ජන බලවේගය
අංක: 592, බංගලා හංදිය, කෝට්ටේ පාර,
පිටකෝට්ටේ.